කෘෂිකර්ම අමාත්‍යාංශය
පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

# ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය

## (ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය)

# තනතුරු ඇබෑර්තු

ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ (ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය) ව්‍යාපෘති නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

## ව්‍යාපෘති නිලධාරී - තනතුරු 01

මෙම මණ්ඩලයේ කාර්යන් සිදුකරන දිවයිනේ විවිධ ප්‍රදේශවල ක්ෂේත්‍ර මට්ටමින් හා ග්‍රාමීය මට්ටමින් රාජකාරි කිරීමට සිදුවේ.

### අධ්‍යාපන සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්ම විද්‍යාවේදී මූලික උපාධියක්.

වයස : අවු. 22 නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය : MA 3- රු. 32,200 - 10x445 -11x660-10x730-5x750- රු. 54,960 ඉහත වැටුපට ජීවන වියදම් දීමනාව වන රු. 7,800/- ක් එකතු කරනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ - මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිත වේ, සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගේ වැටුපෙන් 8% ක දායකත්වය ලබාගන්නා අතර ආයතනය 12% කින් දායක වේ. මෙයට අමතරව වැටුපෙන් 3% කට සමාන මුදලකින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ආයතනය දායක වේ.

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් තමාගේ ජීව දත්ත වාර්තාවක් ආවරණ ලිපියක් සහිතව අධ්‍යාපන සහතිකවල ඡායාපිටපත්, අනෙකුත් අදාල සහතික වල ඡායා පිටපත් සහ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහිතව, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2020/12/14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම් කරන තනතුර, කවරයේ වම් ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතන වල අයදුම්පත් අදාල ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. උක්ත කොන්දේසි සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

සභාපති

**ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය.**

නො.45, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට, කොළඹ-05

දුරකථන අංක : 0112580194, 0112506895 E-mail-ffhc.srilanka@gmail.com